සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## පුරවැසි අධ්‍යාපනය I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | 3 | (21) | 3 | (31) | 4 |
| (2) | 2 | (12) | 4 | (22) | 1 | (32) | 1 |
| (3) | 1 | (13) | 1 | (23) | 2 | (33) | 2 |
| (4) | 4 | (14) | 2 | (24) | 4 | (34) | 3 |
| (5) | 3 | (15) | 4 | (25) | 3 | (35) | 2 |
| (6) | 2 | (16) | 3 | (26) | 4 | (36) | 4 |
| (7) | 4 | (17) | 3 | (27) | 1 | (37) | 2 |
| (8) | 1 | (18) | 1 | (28) | 2 | (38) | 3 |
| (9) | 2 | (19) | 2 | (29) | 2 | (39) | 1 |
| (10) | 1 | (20) | 1 | (30) | 3 | (40) | 4 |

(ලකුණු 1x40=40)

## පුරවැසි අධ්‍යාපනය II

(01) (i) 1. සෘජු 2. වක්‍ර (ලකුණු 02)

(ii) අන්‍යා මත ගරු කිරීම, සාකච්ඡා මගින් තීරණවලට එළඹීම, සමොනාත්මතාවය ගරු කිරීම
(මින් දෙකක් දැක්වීමට ලකුණු 02)

(iii) බහුවිධතාවය තුළින් එක්සත් බව ගොඩනැගීම, ප්‍රතිවිරුද්ධ මත නියෝජනය වීම, බලයේ සිටින ආණ්ඩු පක්ෂයේ/ පක්ෂවල අහිතකර ක්‍රියාදාමයන් සංවර්ධනාත්මකව විවේචනය කිරීම, අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම
(මේවායින් දෙකක් සඳහන් කිරීමට ලකුණු 02)

(iv) කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්කවලින් දෙකක් සඳහන් කිරීමට (ලකුණු 02)

(v)
- රාජ්‍ය බල අධිකාරය මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීම
- බලය බෙදා හැර තිබීම
- සන්ධීය රාජ්‍යය තුළ මධ්‍යම සහ ප්‍රාන්ත වශයෙන් බල මධ්‍යස්ථාන දෙකක් දැකිය හැකි වීම

(මින් දෙකක් දැක්වීමට ලකුණු 02)

(vi) දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය, ආර්ථික බලය (මින් දෙකකට ලකුණු 02)

(vii) නඩු ඇසීම, මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, නීති අර්ථකථනය කිරීම, පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම
(මින් කාර්යයන් දෙකක් නම් කිරීමට ලකුණු 02)

(viii) පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම, පෞද්ගලික ව්‍යවසායන් දිරිගැන්වීම, පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම, ආර්ථික ලිහිල්කරණය
(මින් ලක්ෂණ දෙකක් සඳහා ලකුණු 02)

(ix) ටී.බී.ටයිලර්, චාර්ල්ස්. ඒ. එල්වුඩ්, ඊ.ටී.හීලර් (දෙදෙනෙකුගේ නම් ලිවීමට) (ලකුණු 02)

(x) ආගමික වතාවත් සඳහා යොමුවීම, මනෝ විද්‍යාත්මක අභ්‍යාස මගින්, උපදේශනය මගින්, ස්වාභාවික පරිසරය නිරීක්ෂණය මගින්
(යන අංශ දෙකක් දැක්වීම සඳහා) (ලකුණු 02)

(02) (i)
- එංගලන්තය
- ප්‍රංශය (නම් කිරිමට) (ලකුණු 02)

(ii)
- රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
- පුනරුදය
- වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීම
- විද්‍යාත්මක දැනුම වර්ධනය
  මේවායින් කරුණු තුනකට (ලකුණු 03)

(iii)
- නිකොලායි මැකියාවේලි
- ජීන් බොඩෑන්
- තෝමස් හොබ්ස් යන චින්තකයන්ගෙන් දෙදෙනෙක් නම් කිරීම හා හේතු විස්තර කිරීමට
  (ලකුණු 05)

(03) (i)
- පළාත් සභා ලැයිස්තුව
- ඊට අයත් කාර්යයන් ගණන 37කි. (ලකුණු 02)

(ii) i. සමාගාමී ලැයිස්තුව - ඊට අදාළ බලතල හා කාර්යන් ගණන 36කි. (ලකුණු 02)

ii. කෘෂිකර්මයට සම්බන්ධ කර්මාන්ත පිහිටුවීමට සහ වැඩි දියුණු කිරීම, ගොවිපොළවල් පිහිටුවීම හා නඩත්තුව, පෞද්ගලික තවාන් අධීක්ෂණය, පස සංරක්ෂණය යන ඒවායින් එකක් දැක්වීමට
(ලකුණු 01)

(iii)
- උන්හිටි තැන් අහිමිවූවන්ට සහන සැලසීම, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සහ සහන සැලසීම, ගංවතුර, නියඟ, වංසගත හෝ වෙනත් අසාමාන්‍ය කරුණු නිසා ඇති වූ ආපදාවල දී සහන සැලසීම, ඒවායින් හානියට පත්වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම හා නැවත පදිංචි කිරීම යන විස්තරවලට (ලකුණු 05)

(04) (i)
- පිහිටීම
- සංක්‍රමණ
- ආක්‍රමණ
- විවිධ ජාතීන් වෙළෙඳාම සඳහා පැමිණීම
- ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම
  (මේවායින් දෙකක් සඳහන් කිරීමට ලකුණු 03)

(ii)
- ජනවර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වීම.
- එකිනෙකා අතර අවබෝධය පුළුල් වීම.
- පාලන කටයුතු සඳහා සියළු ජනවර්ග හා ජන කණ්ඩායම්වල සහභාගීත්වය වර්ධනය වීම.
- එකිනෙකාට ගරු කිරීමට හුරුවීම.
- ආගමික හා සංස්කෘතික විවිධතා නොසලකා සහජීවනයයෙන් කටයුතු කිරිම.
- නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත් වීම.
- විනිවිද භාවයෙන් කටයුතු කිරීම.
  මේවායින් තුනක් සඳහන් කිරීමට ලකුණු 03)

(iii)
- ජාතික සමඟිය හා සහජීවනය වර්ධනය වීම
- අන්‍යෝන්‍ය සුහදතාව හා විශ්වාසය වර්ධනය වීම

- ගැටුම් අවම වීම
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වීම
- අන්‍ය ආගම් හෝ සංස්කෘතීන්ට නිගරු නොවන ආකාරයට හැසිරීමට හුරුවීම

යන කරුණු දෙකක් කෙටියෙන් විස්තර කිරීමට (ලකුණු 05)

(05) (i)
- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

(මේවායින් දෙකක් සඳහන් කිරීමට) ( ලකුණු 02)

(ii)
- නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය යන ක්‍රියාවලි තුන. (ලකුණු 03)

(iii) ධනවාදී හා සමාජවාදී අර්ථ ක්‍රම දෙකෙහිම ලක්ෂණ ඇතුළත් අර්ථ ක්‍රමය මිශ්‍ර අර්ථ ක්‍රමය වේ.
ශ්‍රී ලංකා අර්ථ ක්‍රමය තුළ දැකිය හැකි මිශ්‍ර අර්ථ ක්‍රමයක ලක්ෂණ :-
- නිෂ්පාදන සාධකවල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයම සතුවීම
- මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා රජය හා පෞද්ගලික යන දෙඅංශයම ක්‍රියා කිරීම
- වෙළෙඳපොළ මත භාණ්ඩවල මිල තීරණය වුවද රජය ඒ සඳහා මැදිහත් වීම
- පොදු යහපත සඳහා සුබසාධන කටයුතු කිරීමට රජය මැදිහත් වීම

ලක්ෂණ දෙකට ලකුණු 02 විස්තර කිරීමට ලකුණු 03යි (ලකුණු 05)

(06) (i)
- වැඩ ලෝකය පුළුල් වීම
- ගෝලීය වෙළෙඳපොල පුළුල් වීම
- ලෝකයේ ඕනෑම රටක ජීවත් වීමට හැකිවීම
- නව දක්ෂතා හා හැකියා අනුව වෙනස් රටක සේවය කිරීමට හැකිවීම
- අඩු මිළට ශ්‍රමය ලබාගත හැකි රටවලට කර්මාන්ත සංක්‍රමණය වීම

(මේවායින් දෙකක් සඳහන් කිරීමට ලකුණු 02)

(ii)
- බහුජාතික සමාගම් බිහිවීම
- විවිධ රටවල පවතින බදු සහන, අඩු මිලට ශ්‍රමය, ලිහිල් පාරිසරික නීති වැනි සාධක පදනම් කරගෙන ආයෝජනය කිරීම
- විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ලෝකයට හඳුන්වා දීම
- විවිධ කලාපීය සහයෝගිතා සංවිධාන බිහිවීම
- දේශීය මුදල් විදේශවලට ඇදීයාම
- ලෝකයේ බලවත් රටවල් තම දේශපාලන බලය අනෙකුත් රටවලට ව්‍යාප්ත කිරීමට
- තොරතුරු තාක්ෂණයේ විප්ලවීය වෙනසක් සිදුවීම
- නිර්බාධ වෙළදාම ඇතිවීම
- ශ්‍රම හා ප්‍රාග්ධන සචලතා
- ලෝක නිෂ්පාදන මත ආර්ථික කටයුතු සිදුවීම

මේවායින් තුනක් සඳහන් කිරීමට (ලකුණු 03)

(iii)

| සංවිධාන | අරමුණු |
|---|---|
| ◆ යුරෝපා සංගමය (EU) | මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් කිරීම<br>නිර්බාධා වෙළෙදාම ව්‍යාප්ත කිරීම |
| ◆ උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) | නිදහස් වෙළෙදාම |
| ◆ දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම (SAPTA) | කලාපීය වෙළෙඳාම පුළුල් කිරීම |

- බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගීතා සංගමය (BIMST - EC) — රෙදිපිළි, ඇඟලුම් ඖෂධ හා තොරතුරු තාක්ෂණ ආදී ක්ෂේත්‍රවල ආයෝජන පුළුල් කිරීම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දිරිගැන්වීම, තාක්ෂණික, භූවමාරුව හා කලාපීය සහයෝගීතාව ඇති කිරීම

  සංවිධාන දෙකක් නම් කිරීමට ලකුණු 02 අරමුණු පැහැදිලි කිරීමට ලකුණු 03 (ලකුණු 05)

(07) (i)
- අභ්‍යන්තර ගැටුම්
- අන්තර්ජාතික ගැටුම්

(නම් කිරීමට ලකුණු 02)

(ii)
- වාර්ගිකත්වය
- දේශපාලන මතවාද
- ආගමික මතවාද
- සමාජ ආර්ථික ගැටලු

(මේවායින් තුනක් සඳහන් කිරීමට ලකුණු 03)

(iii) සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ
- සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමුවීම
- පෞද්ගලික හෝ විශ්වාසනීය මට්ටමින් සිදුවීම
- ක්ෂණික විසඳුම් ලැබීම
- වියදම් අවම ක්‍රමයක් වීම
- අවිධිමත් ව්‍යුහයකින් යුක්ත වීම
- දෙපාර්ශ්වයටම "ජය - ජය" විසඳුම් ලැබීම

  ගති ලක්ෂණ දෙකට ලකුණු 02 විස්තර කිරීමට ලකුණු 03යි (ලකුණු 05)